# අසහාය කවපෙති විසිකරන්නා ගේ සමුගැනීම

මුළු ලෝකයම එකම වේදිකාවක දී තම තමන්ගේ කුසලතාවන් රඟ දක්වන මහා ක්‍රීඩා සැණකෙළිය ලෙසින් ඔලිම්පික් ක්‍රීඩා උළෙල සැලකිය හැකිය.

එවන් තැනකදී ජය ධද ලෙලවන්න ට සමත් වෙන ඕනෑම ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩිකාවක එක් රැයකින් මුළු ලොවේම ආදරය දිනා ගැනීමට තරම් වාසනාවන්තය. එක ඔලිම්පික් උළෙලකදී එක් ජයග්‍රහණයකින් සිය අභිමාර්ථ මුදුන් පමුණුවා ගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන් එමටය. එහෙත් එක දිගට ඔලිම්පික් ක්‍රීඩා උළෙල 4 කදීම වාර්තා පිට වාර්තා තබමින් රන් පදක්කම් දිනා ගැනීම පහසු කාර්යයක් ලෙස සඳහන් කල නොහැකිය.

මේ වනවිට එවන් හපන්කමක් කර ඇත්තේ ක්‍රීඩකයින් දෙදෙනෙකු පමණක්වීම එහි ඇති අසීරුතාව වඩාත් පැහැදිලි කරනු ඇත.

එක් ක්‍රීඩකයෙකු මෙම දක්ෂතා ලෝකයා හමුවේ තැබුවේ මලල ක්‍රීඩාවට අයත් ජවන ඉසව් හරහාය. ඔහු අමරිකානු ක්‍රීඩක කාල් ලුවිස් ය. එහෙත් ඔහුට පූර්වාදර්ශය සැපයූ අනෙක් ඇමරිකානු ක්‍රීඩකයා සිය හපන්කම් ප්‍රදර්ශණය කර ඇත්තේ මලල ක්‍රීඩාවට අයත් පිටිය ඉසව් ඔස්සේ ය.

බොහෝදෙනෙකු ඔහු දැන හඳුන් වන්නේ ''අල් ඔයෙටර්'' යනුවෙනි. මෙහි එන අල් යන වචනය නිසා ඔහු මුස්ලිම් ජාතිකයෙකු යැයි කෙනෙකුට සිතෙන්නට බැරි නැත. එහෙත් ඔහුගේ සම්පූර්ණ නම සඳහන් කරන කල්හි තත්ත්වය ඊට ඉඳුරාම වෙනස්ය. හේ නමින් ඇල්ෆඩ් අඩොල්ෆ් ඔයෙටර් ය.

ඔයෙටර් කවපෙත්ත විසිකිරීමේ ඉසව්ව ඔස්සේ සදාකාලික වීරයෙකු ලෙස ක්‍රීඩා පිටියෙන් සමු ගන්නද ඔහු ජයගත් සෑම තරගයකටම ඉදිරිපත් වනවිට ජයග්‍රහණය අතේ මිට මොලවාගෙන තරග වැදුණු ක්‍රීඩකයෙකු ලෙස කිසිවෙකුත් දැක නොතිබීම විශේෂත්වයකි.

ප්‍රකට ප්‍රබල ක්‍රීඩකයින් හා පිටුපසින් සිටිමින් 1956, 1960, 1964 හා 1968 යන වර්ෂයන් හි පැවති ඔලිම්පික් ක්‍රීඩ උළෙලවලදී කවපෙත්ත විසිකිරීමේ ඉසව්වට ඉදිරිපත් වූ ඔයෙටර් ඒ සෑම අවස්ථාවකම ඔලිම්පික් රන් පදක්කම් දිනා ගත්තේ නව ඔලිම්පික් වාර්තා ද පිහිටුවමිනි.

විශේෂයෙන්ම ඔහු තම මංගල ඔලිම්පික් තරගයට 1956 වසරේ මෙල්බන් හිදී සහභාගි වී ඇත්තේ කන්සාස් සරසවි සිසුවෙකු ලෙසිනි. මේ නිසා එවර එහි රන් පදක්කම තවත් ඇමරිකානු ක්‍රීඩකයෙකු වූ ෆෝවුන් ගෝර්ඩියස් දිනා ගනු ඇතැයි ක්‍රීඩාලෝලීන් විශ්වාස කළේය.

එහෙත් විශාල පෙරළියක් පළමු පියවරේදීම රඟ දැක්වූ ඔයෙටර් තම සුරතින් මුදා හරින ලද කවපෙත්ත මීටර් 56.36 ක දුරකින් පතිත කොට පළමු ඔලිම්පික් රන් පදක්කම නව වාර්තාවක් ද සහිතව ගෙළ ලා ගත්තේය.

එතැන් සිට ගතවූ වසර දෙකක කාලය තුළ කවපෙත්ත විසිකිරීමේ ඉසව්වේ හොඳම ඇමරිකානු ක්‍රීඩකයා ඔයෙටර් විය. නමුත් 1960 ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා වන තෝරා ගැනීමේ තරගයකදී ඔහු රින්ක් බබ්කා නම් වූ ඇමරිකානු ක්‍රීඩකයා හමුවේ දෙවැන්නා බවට පත්ව තිබුණි. එහෙත් එම ඔලිම්පික් ක්‍රීඩා උළෙලේදී බබ්කා ද පරාජය කරමින් මීටර් 59.18 ක දුරක් හා නව වාර්තාවක්ද සහිතව රන් පදක්කම දිනා ගන්නට ඔයෙටර් සමත් විය.

ඔලිම්පික් ක්‍රීඩා උළෙලක කවපෙත්ත විසිකිරීමේ ඉසව්ව සඳහා ඔයෙටර් හොඳම සටනට මුහුණ දුන්නේ 1964 වසරේ ජපානයේ ටෝකියෝ නගරයේ පැවැති ඔලිම්පික් ක්‍රීඩා උළෙලේදීය.

එම තරගයට ඉදිරිපත්ව සිටි වෙකෝස්ලෝවැකියානු ක්‍රීඩක ලුඩ්විග් ඩනෙක් ඒ දක්වා වූ තරග 45 ක් එක දිගට ජයගෙන සිටි බැවින් බොහොදෙනෙක් එවර ඔයටර් ට රන්පදක්කම අභිමිවනු ඇතැයි ප්‍රකාශ කර තිබුණි.

කෙසේ වුවත් එම තරගයේ පස්වැනි වටය තෙක් දෙදෙනා අතර පැවතියේ කරට කර තරගයකි. එහෙත් පස්වැනි උත්සාහයේදී බෙල්ලේ හටගත් ආබාධයක් නිසා ලුඩ්විග් ඩනෙක් තරගයෙන් ඉවත්වීමත් සමග එක දිගට කවපෙත්ත විසිකිරීමේ ඉසව්වෙන් ඔලිම්පික් රන් පදක්කම් 03ක් දිනාගත් පළමු ක්‍රීඩකයා ලෙස අල් ඔයෙටර් නාමය ඉතිහාසයේ සටහන් කරන්නට ඔහුට හැකිවිය. එවරද ඔහු මීටර් 61.00 ක දුරක් සහිතව නව ඔලිම්පික් වාර්තාවක් පිහිටුවීම විශේෂත්වයක් ලෙස සඳහන් කළ හැකිය.

යළිත් 1968 වසරේ පැවැති ඔලිම්පික් උළෙලේදී ද මීටර් 64.78 ක දුරක් කවපෙත්ත විසිකොට ඔලිම්පික් වාර්තාව අලුත් කළ ඔයෙටර් අනතුරුව ක්‍රීඩා ලෝලීන්ගේ නොමඳ ප්‍රශංසා සහිතව ක්‍රීඩා පිටියෙන් සමු ගත්තේය.

ඉහත තරගයේදී ලුඩ්විග් ඩනෙක් මෙන්ම ලෝක වාර්තාවේ හිමිකරු වූ ජේ. සිල්වෙස්ටර් ද ඔහු හමුවේ පරාජයට පත්ව තිබුණි.

ක්‍රීඩාවෙන් සමුගත්තද කවපෙත්ත අත හරින්නට අකමැත්තක් දැක්වූ ඔයෙටර් නැවතත් 1980 හා 1984 වර්ෂයන් හි පවත්වන ලද ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා සහභාගි කරවන ඇමරිකානු කණ්ඩායම් තෝරා ගැනීමේ තරගවලට ඉදිරිපත් විය. ඒ අතරින් විශේෂයෙන්ම 1980 වසරේ තෝරා ගැනීමේ තරගයේදී එවකට 43 හැවිරිදි වියේ පසුවූ ඔයෙටර් තරුණ ක්‍රීඩකයන්ට අභියෝග එල්ල කරමින් මීටර් 69.46 ක දුරක් කවපෙත්ත විසිකර තිබුණි. එම දුර ඔලිම්පික් තරගයට තෝරා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවූවද එය ඔහු වාර්තා කළ හොඳම දුර ප්‍රමාණය ලෙස සටහන් ව ඇත.

පසුකාලීනව කවපෙත්ත වෙනුවට පැන්සල හා පින්සල සුරතේ රඳවා ගත් ඔහු දුටු පමණින් බොහෝ දේ සිතන්නට පුරුදු කරවන සිතුවම් ඇඳීමට පුරුදුව සිටියේය. ඒක පුද්ගල චිත්‍ර ප්‍රදර්ශණ කිහිපයක්ම පවත්වා තිබූ ඔහුගේ සිතුවම් රැසකටද විවිධ වූ සම්මාන හිමිව තිබුණි. මේ අසහාය ක්‍රීඩකයා එසේත් නැත්නම් සුවිශේෂී මිනිසා වසර 71 ක් වූ සිය ජීවිත කාලය පසුගිය ඔක්තෝබර් 1 වැනිදා නිමාවට පත් කරනු ලැබිය.

එහෙත් ලෝකයට බොහෝ දේ ඉතුරු කර තැබීම පිළිබඳ අප ඔහුට තුති පිදිය යුතුය.

- මලිඳු කවිලංක එදිරිවීර -

# පන්දුවාර 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ සැඟවුන ප්‍රතිඵල

(මලිඳු කවිලංක)

පළමු වන පන්දුවාර 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ ශූරතාව ඉන්දියාවටත්, අනුශූරතාව පාකිස්ථානයටත් හිමිකර දෙමින් පසුගියදා දකුණු අප්‍රිකාවේදී නිමාවට පත්වුණා.

මේ වනතෙක් ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාවෙන් එක්දින ක්‍රිකට් ක්‍රීඩාවේත් අංක එකේ කණ්ඩායම ලෙස ක්‍රිකට් පිටියේ සෑම අංශයකම බලය පතුරුවා ගෙන සිටින ඕස්ට්‍රේලියාව මෙහිදී ශූරතාව දිනා ගනු ඇතැයි බොහෝ දෙනෙකු සිතුවද ඒ සිතුවිල්ල තරමක සැකයට ලක් කෙරෙන සිදුවීම් තරගාවලිය ආරම්භයේ සිටම සිදුවනු දක්නට ලැබිණි.

ඕස්ට්‍රේලියානුවන් මුල් වටයේදී සිම්බාබ්වේ වැනි දුර්වල කණ්ඩායමක් හමුවේ පවා පරාජය වූ අතර අවසන් පූර්ව වටයේ දී ඔවුන් පාකිස්තානුවන් හමුවේ පරාජයවීම නිසා පන්දුවාර 20 ක්‍රිකට් ක්‍රීඩාවේදී තමන් පරාජය කිරීමට අපහසු කණ්ඩායමක් නොවන බව ඕස්ට්‍රේලියානුවන් විසින් ප්‍රතිවාදී කණ්ඩායම්වලට ඒත්තු ගන්වනු ලැබුවා.

ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියක් පවත්වනු ලැබුවත් ඒ වනවිට පන්දුවාර 20 ක්‍රිකට් ක්‍රීඩාවෙන් කිසිම කණ්ඩායමක් විශාල අත්දැකීම් ප්‍රමාණයක් ලබා තිබුණේ නැහැ. ඒ නිසා මේ තරගාවලිය ඒ හැම කණ්ඩායමකටම ලබා දී තිබුණේ පෙරහුරුවක් ලබා ගැනීම සඳහා කදිම අවස්ථාවකි.

කොහොම වුනත් පාපන්දු, රගර්, වොලිබෝල්, පැසිපන්දු වැනි කණ්ඩායම් ක්‍රීඩාවන් හා සසඳන විට ශත වර්ෂයකට වඩා පැරණි ක්‍රීඩාවන් අතර ලෝකය පුරා ව්‍යාප්තවීම අතින් ක්‍රිකට් ක්‍රීඩාව ගමන් කර ඇත්තේ ඉබි ගමනකි.

ක්‍රිකට් තරගයක් සඳහා දින 5 ක් වැනි කාලයක් ගතවීම, එපමණ කාලයක් ගතවී වුවද බොහෝවිට ජය පරාජය නොවිසඳියාම වැනි කරුණු ක්‍රීඩකයන් මෙන්ම ක්‍රීඩා ලෝලීන්ද ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඈත් කර තබන්නට හොඳටම ප්‍රමාණවත් වී තිබුණි.

එක්දින ක්‍රිකට් ක්‍රීඩාව කරළියට පැමිණෙන්නේ ඉහත තත්ත්වයට පිළියම් සෙවීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. ඇත්ත වශයෙන්ම එම එක්දින ක්‍රිකට් ක්‍රීඩාව ක්‍රීඩකයින්ගේ මෙන්ම ප්‍රේක්ෂකයන්ගේද වැඩි ආකර්ෂණයක් දිනා ගන්නට සමත් වුණා.

ක්‍රීඩාව වෙනුවෙන් 1975 වසරේ පළමු වරට ලෝක කුසලාන තරගාවලියක් පවත්වන්නේද මෙම එක්දින ක්‍රිකට් ක්‍රීඩාවෙන් වීමත් එහි ජනප්‍රියත්වය වඩාත් පැහැදිලි කර ගැනීම පහසුය.

කෙසේ වුවත් ලෝකය ඉතා වේගයෙන් දවසින් දවස ඉතා කාර්ය බහුල තත්ත්වයකට පත්වෙද්දී දිනකට අයත් පැය 24 කෙනෙකුට සිය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා හොඳටම ප්‍රමාණවත් නොවන තත්ත්වයක් උදාවෙද්දී ක්‍රීඩාවක් වෙනුවෙන් එක් දිනක් වෙන් කිරීම කළ නොහැකි දෙයක් බවට පත් වෙන්නට පටන් ගත්තා. ඒ නිසා යළිත් ක්‍රිකට් ක්‍රීඩාවේ යළිත් ආපස්සට ගමන් කරණ තත්ත්වයක් ඇති වුණා. පන්දු වාර 20 ක්‍රිකට් ක්‍රීඩාව කලඑළි බසින්නේ එවන් පරිසරයක් තුළය. ඒ නිසා පැය තුනක් ඇතුළත ජය පරාජය සහිතව අවසන් වන මේ ක්‍රිකට් ක්‍රීඩාව ජනප්‍රියවීමට වැඩි කාලයක් ගතවුණේ නැහැ.

කොහොම නමුත් පළමු පන්දුවාර 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය පවත්වන විට කිසිම රටකට ඒ සම්බන්ධයෙන් විශාල පළපුරුද්දක් තිබුණේ නැහැ. වඩාත් සාර්ථක අත්හදා බැලීම් සිදුකළ කණ්ඩායම් අතර ජයග්‍රහණයත් බෙදී ගියේ ඒ නිසා බව සිතිය හැකිය.

ඉන්දියාව ශූරතාවත්, පාකිස්ථානය අනුශූරතාවත් දිනා ගත්තේ ඒ අනුවය. නමුත් මේ කණ්ඩායම් දෙකම ඊට නොබෝ කලකට පෙර බටහිර ඉන්දීය කොළඹ දූපත් හි පැවති ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ පළමු වටයේ තරග දෙකකට සහභාගිවීමෙන් පසු තරගාවලියෙන් ඉවතට විසිවූ කණ්ඩායම් දෙකක් බවද අමතක කල යුතු නැහැ. ඇත්ත වශයෙන්ම ඔවුන්ට එහිදී හිමිවූ පරාජයන් මෙම තරගාවලියේදී ජයග්‍රහණය සොයා යන්නට ආශීර්වාදයක් වූ බව පැහැදිලිය. ඔවුන් විවිධ අත්දැකීම් කරන්නට පෙළඹෙන්නට ඇත්තේ ඒ නිසා විය හැකිය.

මේ අනුව පන්දුවාර 20 ක්‍රිකට් තරගාවලියට ඉන්දියාව සචින් ටෙන්ඩුල්කාර්, රාහුල් ඩාවිඩ්, සවිරව් ගන්ගුලි හා ශෙහීර් බාන් වැනි පළපුරුදු ක්‍රීඩකයින්ට වඩා නවක යොමුන් ක්‍රීඩකයින් කෙරේ විශ්වාසය තබා තිබුණි. නායකත්වයද මහේන්ද්‍ර සිං දෝනිට පිළිගන්වනු ලැබුවා.

පාකිස්ථාන පිලේ ද දක්නට ලැබුනේ ඊට බොහෝ සමාන තත්ත්වයක්. මොහොම්ඩ් යුසුෆ්, ෂොයිබ් අක්තාර්, ඉන්සමාම් උල් හක්, අසාර් මෙහෙමුද් හා ධනිෂ් කනෙරියා වැනි පළපුරුදු ක්‍රීඩකයින් කණ්ඩායමට ඇතුළත්ව සිටියේ නැහැ. නායකත්වයද තරුණ ක්‍රීඩකයෙකු වූ ෂොයිබ් මලික්ට භාර දී තිබුණා.

මෙම රටවල් දෙකේ ක්‍රිකට් පරිපාලනයන් සම්ප්‍රදායෙන් බැහැර වී කළ නව අත්හදා බැලීම් මල්ඵල ගන්වමින් ඔවුන් එහි ශූරතාව හා අනුශූරතාව බෙදා ගත්තා.

එහෙත් ශ්‍රී ලංකාවේ තිබුණේ ඊට බොහෝ වෙනස් තත්ත්වයක්. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ක්‍රිකට් තේරීම් කමිටුව විශ්වාසය තැබුවේ පැරණි ක්‍රීඩකයින් වෙතය. ඇත්ත වශයෙන්ම ඔවුනට හොඳ කණ්ඩායමක් තෝරා ගැනීමේ සැබෑ උවමනාවක් තිබුනේ නම් ලෝක කුසලාන තරගාවලියේදී දිගින් දිගටම අසාර්ථක වෙද්දීත් අවස්ථාව ලබාදුන් ක්‍රීඩකයින් වෙනුවට වෙනත් ක්‍රීඩකයින් අත්හදා බලන්නට හැකියාව තිබුණා. නමුත් ඔවුන් ඒ වටිනා අවස්ථාව පැහැර හැරියා.

සමහර විට ලෝක ශූර ඕස්ට්‍රේලියාව පවා මෙම තරගාවලියේදී පරාජය වූ බව අපේ තේරීම් කමිටුව නිදහසට කරුණු ලෙස ඉදිරිපත් කළ හැකිය. එය එසේ නම් ඔවුනට ප්‍රතිඵලත්තර ලෙස ප්‍රකාශ කළ හැක්කේ ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ පළමු වටයෙන්ම ඉවත් වූ ඉන්දියාව හා පාකිස්ථානය පන්දුවාර

28 වන පිටට